# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
# කෙඩෙට් නිලධාරී/නිලධාරිණියන් බඳවා ගැනීම - පාඨමාලා අංක 42

## ඇප බැඳුම්කර සකස් කර ගැනීම සඳහා උපදෙස් පත්‍රිකාව

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගි වූ ඔබට සුබ පතනු ලබන අතර අවසන් වෛද්‍ය පරීක්ෂණය සමත් වීමෙන් අනතුරුව උපාධි පාඨමාලා හැදෑරීම සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන් මෙම විශ්වවිද්‍යාලය වෙත බඳවා ගැනීමට කටයුතු සූදානම් කර ඇත.

උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් නියමිත දිනට විශ්වවිද්‍යාලය වෙත පැමිණිය යුතු අතර ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා පහත ලේඛන වල මුල් පිටපත රැගෙන ඒම අනිවාර්ය වේ.

i. උප්පැන්න සහතිකය
ii. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතිකය
iii. අ.පො.ස. (උසස් පෙළ) සහතිකය

(ii, iii) විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල සහතිකය වීම අනිවාර්ය වේ (පාසලෙන් නිකුත් කල සහතික අදාල නොවේ)

iv. පාසැල් හැරයාමේ සහතිකය
v. ග්‍රාම නිලධාරී සහතිකය
vi. පොලිස් සහතිකය
vii. චරිත සහතික 2 ක් (එක් චරිත සහතිකයක් පාසලෙන් ලබා ගත් එකක් විය යුතුය)
viii. ජාතික හැඳුනුම්පත
ix. **ඉහත සියලු සහතික සහ ලේඛනවල ඡායා පිටපත් 3 බැගින්**
x. පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප 02 ක්
(**රතුපාට පසුබිම, ප්‍රමාණය 35mm x 45mm**" ඡායාරූපයට පෙනී සිටිය යුතු ආකාරය Gents - Shirt and Tie with blazer / Ladies – Kandyan/ Indian Saree with blazer )
xi. ඇප බැඳුම්කරයට අත්සන් තබන පුද්ගලයන් දෙදෙනාගේ ජාතික හැඳුනුම්පත හා එහි **ඡායා පිටපත බැගින්**
xii. ක්‍රීඩා සහතික වල (ලබා ඇති ඉහලම ජයග්‍රහණ) සහතික කරන ලද **ඡායා පිටපත්**
xiii. ශිෂ්‍යභට සහ බාලදක්ෂ සහ බාලදක්ෂිකා සහතික වල (ලබා ඇති ඉහලම නිලය සනාථ කරන) සහතික කරන ලද **ඡායා පිටපත්**

- **උප්පැන්න සහතිකයට අනුව ඉහත සහතික වල නම් පිළිබඳ වෙනස්කම් තිබේ නම් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.**

- **සහතික වල ඡායා පිටපත් ඉදිරිපත් කිරීමේදී A4 ප්‍රමාණයෙන් ඉදිරිපත් කල යුතුය.**

**පහත ආකෘති පත්‍ර සම්පූර්ණ කර රැගෙන ආ යුතුය.**

xiv. ආරක්ෂක නිශ්කාෂණ ලබා ගැනීමට අදාල පුද්ගලික තොරතුරු පත්‍රිකා 02 ක් www.kdu.ac.lk මගින් ලබා ගත හැකිය.
xv. වෛද්‍ය වාර්තාව www.kdu.ac.lk මගින් ලබා ගත හැකිය.
xvi. ශිෂ්‍ය පුද්ගලික තොරතුරු පත්‍රිකාව www.kdu.ac.lk මගින් ලබා ගත හැකිය.

***සටහන : ඔබ දැනටමත් ඉහත ලිපි ලේඛන, දැනුවත් කිරීමේ වැඩසටහනට ඉදිරිපත් කර ඇත්නම් නැවත ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවනු ඇත.***

**මෙම විශ්වවිද්‍යාලය වෙත කෙඩෙට් නිලධාරින් ලෙස ඇතුලත්වීමේදී ඔබ ගිවිසුමකට හා ඇප බැඳුම්කරයකට අත්සන් කල යුතුය.**

**ඇප බැඳුම්කර වටිනාකම් පහත දැක්වේ.**

| අනු අංකය | උපාධි පාඨමාලාව | බැඳුම්කර වටිනාකම (රු.) |
|---|---|---|
| 1 | විද්‍යාවේදී ක්‍රමෝපායික අධ්‍යයන සහ ජාත්‍යන්තර සබඳතා | 3,400,000/- |
| 2 | වෛද්‍යවේදී සහ ශල්‍යවෛද්‍යවේදී (එම්.බී.බී.එස්) | 32,000,000/- |
| 3 | විද්‍යාවේදී ඉංජිනේරු (ගෞරව) | 6,600,000/- |

| අනු අංකය | උපාධි පාඨමාලාව | බැඳුම්කර වටිනාකම (රු.) |
|---|---|---|
| 4 | නීතිවේදී | 5,600,000/- |
| 5 | විද්‍යාවේදී කළමනාකරණ හා තාක්ෂණික විද්‍යා | 3,600,000/- |
| 6 | විද්‍යාවේදී ක්‍රමකාර්ය සම්පාදන කළමනාකරණ | 3,800,000/- |
| 7 | විද්‍යාවේදී සමාජ විද්‍යා | 3,600,000/- |
| 8 | ව්‍යවහාරික දත්ත විද්‍යා සන්නිවේදනය පිළිබඳ විද්‍යාවේදී | 4,400,000/- |
| 9 | වෙනත් භාෂා කථා කරන්නන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රවේදී (TESOL) | 4,400,000/- |
| 10 | විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යා | 4,800,000/- |
| 11 | විද්‍යාවේදී (ගෞරව) මෘදුකාංග ඉංජිනේරු | 4,800,000/- |
| 12 | විද්‍යාවේදී (ගෞරව) පරිගණක ඉංජිනේරු | 5,600,000/- |
| 13 | විද්‍යාවේදී (ගෞරව) දත්ත විද්‍යාව හා ව්‍යාපාර විශ්ලේෂණ | 5,200,000/- |
| 14 | විද්‍යාවේදී (ගෞරව) තොරතුරු තාක්ෂණ | 3,700,000/- |
| 15 | විද්‍යාවේදී (ගෞරව) තොරතුරු පද්ධති | 3,700,000/- |
| 16 | වාස්තුවිද්‍යාවේදී (ගෞරව) | 7,200,000/- |
| 17 | විද්‍යාවේදී (ගෞරව) ප්‍රමාණ සමීක්ෂණ | 5,800,000/- |
| 18 | විද්‍යාවේදී (ගෞරව) මැනුම් විද්‍යා | 5,700,000/- |
| 19 | විද්‍යාවේදී (ගෞරව) කාර්මික සහ සේවා තත්ත්ව කළමනාකරණ | 4,000,000/- |
| 20 | විද්‍යාවේදී (ගෞරව) භූ තොරතුරු | 4,000,000/- |
| 21 | තාක්ෂණවේදී (ගෞරව) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ | 4,300,000/- |
| 22 | විද්‍යාවේදී ඉංජිනේරු තාක්‍ෂණවේදී (ගෞරව) ඉදිකිරීම් තාක්ෂණ | 4,700,000/- |
| 23 | විද්‍යාවේදී පොලිස් විද්‍යා | 3,400,000/- |
| 24 | විද්‍යාවේදී අපරාධ විද්‍යා හා අපරාධ යුක්ති | 3,700,000/- |

**ඇපකරුවන්**

- මෙම ඇප බැඳුම්කරය සඳහා ඇපකරුවන් දෙදෙනෙකු අවශ්‍ය වේ. (මව, පියා හෝ භාරකරු යන අයගෙන් එක් අයෙකුට **<u>පමණක්</u>** ඇපකරුවන් ලෙස ඉදිරිපත් විය හැකිය) තවද ඇපකරුවන් ඉදිරිපත් කිරීමේදී ඔවුන් වයස අවුරුදු 60 ට අඩු 18 ට වැඩි අයවලුන් විය යුතුය.

**ඇපකරුවන්ගේ වත්කම්**

- **ඉහත උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ඇප අත්සන් කිරීමේදී <u>අදාළ බැඳුම්කරයේ වටිනාකමට සමාන වත්කමක් ඇපකරුවන් දෙදෙනා විසින් වෙන වෙනම (සමාන ප්‍රමාණ වලින්) තහවුරු කිරීම අවශ්‍ය වේ.</u>**

## <u>ඇප බැඳුම්කර සඳහා වත්කම් තහවුරු කිරීමට ඉදිරිපත් කල හැකි ආකාර</u>

### 1. ඉඩමක් මඟින්

**ඉදිරිපත් කල යුතු ලියවිලි**

**i. තක්සේරු වාර්තාව (මුල් පිටපත)**

- තක්සේරු වාර්තාව විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා නමට යොමු කර තිබිය යුතුය.

- අදාළ තක්සේරු වාර්තාව, රජයේ ලියාපදිංචි තක්සේරු කරුවෙකු (රජයේ ලියාපදිංචි අංකයක් තිබිය යුතුය) විසින් සකස් කර තිබිය යුතු අතර සෑම පිටුවකම ඔහුගේ නිල මුද්‍රාව තබා අත්සන් කර තිබිය යුතුය.

- තක්සේරු වාර්තාවේ Request for Valuation යන ස්ථානයේ ඉඩමේ අයිතිකරුගේ නම තිබිය යුතුය.

- තක්සේරු වාර්තාවේ Purpose of the Valuation යන්න පහත පරිදි විය යුතුය. (A1 බලන්න)



Name of the Valuer

Residence:
Andupe
Ambepussa
Office:

My No :-
Date :-

Tel:

VALUATION REPORT IN RESPECT OF IN PLAN NO:
, PREPARED BY
LICENSED SURVEYOR

This valuation report is furnished at the request of Mr. ________ of ________ Mr. ________ wishes to ascertain the current open market value of the residential property ~~owned~~ by him. The report is to be submitted to the Vice Chancellor of General Sir John Kotalawala Defense University, Kandawala Estate, Rathmalana.

DATE AND TIME OF INSPECTION: 26th March, 2011 at 11.30 A.M

SITUATION OF THE PROPERTY:

The subject property is situated at ________ village within the administrative limits of ______ Pradeshiya Shaba in ________ of ______ Korale in the District of ______ in Western Province.

ACCESS:

From Kadawatha town proceed along Ganemulla road for about 7.5km upto Ganemulla Bus-stand. Then turn left onto Gansaba Mawatha and travel a distance of about 700 metres to reach the subject property on the left hand side.

NAME AND EXTENT OF THE LAND:

This is an allotment of land called "Millahawatta" The extent as per Plan No: 3158/1, the land marked lot "B" is 0A - 0R - 20P. For further reference the survey plan has been annexed to the report. (Page No: 3)

BOUNDARIES OF THE LAND:

All the boundaries of the land are in accordance with those in the plan and bounded as follows.

North by - Pradeshiya sabha road.
East by - Lot "A".
South by - Lot "A".
West by - Lot 2/2 in plan No.3158.

All the boundaries are demarcated by concrete posts.

DESCRIPTION OF THE PROPERTY:

This is almost a rectangular shaped block of high situated about 3 feet below the access road. The road frontage is about 55 feet on its northern boundary. The land gently slopes from northern boundary towards the southern boundary. The soil of the land is firm and compact and the load bearing capacity is high. The land is not subjected to inundation or water logging. The water table is about 18ft. from the ground level. The plantation consists of seven coconut trees about 25 years and in average bearing. It is a good buildable site and suitable for erecting buildings.

27/03/2011

INCORPORATED VALUER
MEMBERSHIP NO.
ISSUED BY INSTITUTE OF VALUERS OF SRI LANKA
VALIDITY OF THE SEAL ENDS ON

Contd/2

විශ්වවිද්‍යාලයේ උපකුලපති තුමා නමට තක්සේරු වාර්තාව ලබාගත යුතුය

**A 1**

The report is to be submitted to the Vice Chancellor of General Sir John Kotelawala Defence University,

තක්සේරුකරුගේ අත්සන හා නිලමුද්‍රාව සෑම පිටුවකම තිබිය යුතුය

- Boundaries of the land යන ස්ථානයේ ඉඩමේ පිඹුරුපත් අංකය හා මායිම් පැහැදිලිව දක්වා තිබිය යුතුය.
- Legal Aspect යන ස්ථානයේ ඉඩමට අදාල ඔප්පුව පිළිබඳ තොරතුරු පැහැදිලිව දක්වා තිබිය යුතුය.

### ii. ඉඩමේ ඔප්පුව

අදාළ ඔප්පුවේ උපලේඛන යටතේ ඉඩමට අදාළ පිඹුරුපත් අංකය හා දිනය සඳහන් විය යුතුය.

### iii. ඉඩමේ පිඹුර

අදාළ ඉඩම බෙදා වෙන්කල ඉඩමක් විය යුතුය.

**ඉඩම බැංකුවට උකස් කර ණයක් ලබා ගෙන ඇත්නම්**

### iv. බැංකු කළමණාකරු විසින් සහතික කල අදාළ ඉඩමේ ඔප්පුව සහ පිඹුරේ පිටපත්

**v. ලබාගත් ණය මුදල පිළිබඳ විස්තර ඇතුලත්, විශ්වවිද්‍යාලයේ උපකුලපති තුමා නමට බැංකු කළමණාකරු විසින් සහතික කරන ලද ලිපියක් සහ ඉහත අනු අංක සග හි සඳහන් ආකාරයට සකසන ලද තක්සේරු වාර්තාව ඉදිරිපත් කළ යුතුය.**
**(බැංකු කළමණාකරු විසින් සහතික කරන ලද ලිපියේ පහත කරුණු අන්තර්ගත විය යුතුය)**

- ලබා ගෙන ඇති ණය මුදල
- ගෙවීමට ඇති ඉතිරි මුදල
- ණය ලබා ගත් පුද්ගලයාගේ නම
- ඇපයට තැබූ ඉඩමේ ඔප්පු අංකය හා පිඹුරුපත් අංකය
- ඉහත ලිපිය සමග ඇපයට තැබූ ඉඩමේ ඔප්පු හා පිඹුරුපත් වල බැංකු නිල මුද්‍රාව සහිතව සහතික කරන ලද ඡායා පිටපත් ඉදිරිපත් කල යුතුය.

**ගෙවීමට ඇති ණය මුදල හැර බැඳුම්කර වටිනාකම පෙන්විය යුතුය.**

**වැදගත් කරුණු**

- අදාළ කැඩෙට් නිලධාරියාගේ/නිලධාරිණියාගේ මව හෝ පියා ඇපකරුවකු ලෙස ඉදිරිපත් වේ නම් ඒ සඳහා විරෝධතාවයක් නොමැති බව (ස්වාමිපුරුෂයා /භාර්යාව හා ළමයින්) ලිඛිතව ලිපියක් මඟින් ඉදිරිපත් කල යුතුය. **එම ලිපිය සාමදාන විනිශ්චයකරුවකු විසින් සහතික කල යුතුය.**

- හවුල් ඉඩමක් යොදාගනිමින් ස්වාමිපුරුෂයා/භාර්යාව ඇප සඳහා අත්සන් කරන්නේ නම් අනෙක් ප්‍රතිලාභියාගේ කොටසද ඇතුලත්ව මුළු ඉඩමම තක්සේරු කිරීම පිළිබඳව විරෝධතාවයක් නොමැති බවත් තක්සේරුවේදී සිදුවිය හැකි වාසි අවාසි පිළිබඳව දනිමින් ඒ සඳහා කැමැත්ත දුන් බවට වන හවුල් අයිතිකරුවන්ගේ ලිපියක් සමග සම්පූර්ණ වටිනාකම තක්සේරු කර ඉදිරිපත් කල යුතුය.

- වයස අවුරුදු 60 ඉක්මවූ අයෙකු නම් ඇටෝර්නි බලපත්‍රයක් මඟින් තම දරුවෙකුට මේ සඳහා බලය පවරා අදාළ දරුවාට ඇප කරුවෙකු ලෙස අත්සන් කල හැකිය.

- රජයේ ඉඩම් මගින් ඇප බැඳුම්කරය සඳහා වත්කම් පෙන්විය නොහැක.

## 2. ගොඩනැගිල්ලක් මඟින්

ඉඩමක් සමඟ ඇති ගොඩනැගිල්ලක් වත්කම් පෙන්වීම සඳහා ඉදිරිපත් කල හැක.

ඉදිරිපත් කල යුතු ලියවිලි

i. ඉඩමට අදාළ ඉහත සඳහන් ලියවිලි
ii. ගොඩනැගිල්ලෙහි තක්සේරු වාර්තාවක් - අදාළ තක්සේරු වාර්තාවෙහි ක්ෂය දක්වා තිබිය යුතුය
iii. ගොඩනැගිල්ලෙහි අනුමත කල සැලැස්ම
(අදාළ ගොඩනැගිල්ල සඳහා සැලැස්මක් නොමැති නම් ගොඩනැගිල්ල පැහැදිලිව දක්වෙන පරිදි ඉදිරිපසින් හා පසුපසින් ගත් ඡායාරූප කිහිපයක් ඉදිරිපත් කල යුතුය.)

## 3. රථ වාහන මඟින්

**ඉදිරිපත් කල යුතු ලියවිලි**

i. උපකුලපති තුමා නමට රජයේ ලියාපදිංචි තක්සේරු කරුවෙකුගෙන් ලබා ගත් තක්සේරු වාර්තාවක්

- තක්සේරු වාර්තාවේ සෑම පිටුවකම තක්සේරු කරුගේ නිල මුද්‍රාව තබා අත්සන් කර තිබිය යුතුය
- තක්සේරු වාර්තාවේ වාහනයේ එංජින් අංකය හා චැසි අංකය පැහැදිලිව දක්වා තිබිය යුතුය
- වාහනයේ රක්ෂණ ආවරණය
- වාහනයේ ලියාපදිංචි සහතිකය
  අදාළ සහතිකයේ පරම අයිතිකරු යන ස්ථානයේ ඇපකරු ලෙස ඉදිරිපත් වන පුද්ගලයාගේ නම තිබිය යුතුය

**සැලකිය යුතු කරුණු**

- අදාළ ඇපකරුගේ නමට ඇති වාහන පමණක් ඉදිරිපත් කල හැකිය
- කල්බදු ක්‍රමයට මිලදීගෙන ඇති වාහන ඇප සඳහා ඉදිරිපත් කල නොහැකිය.

**4. වැටුප් ලබන්නෙකු**

➡ ඉදිරිපත් කල යුතු ලියවිලි

i. තම ආයතනයෙන් ලබාගත් වැටුප් වාර්තාවක්
(ආයතනයේ ගණකාධිකාරි විසින් සහතික කල වැටුප් වාර්තාව **උපකුලපති තුමා, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** නමට යොමු කර තිබිය යුතු අතර ඇප සඳහා වත්කම් ඉදිරිපත් කිරීමේදී කොටසක් ලෙස වාර්ෂික දල වැටුප යොදා ගත හැකිය.)

**5. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ඇති මුදල්**

➡ ඉදිරිපත් කල යුතු ලියවිලි

- මහ බැංකුව විසින් **අදාල සේවකයාගේ** නමට අදාළ ප්‍රතිලාභියාගේ EPF / ETF යාවත්කාලීන කරන ලද ශේෂ තහවුරු කර ලබා දෙනු ලබන ලිපියක්

**6. වසර 5 කට වඩා වැඩි ස්ථාවර තැන්පතු**

➡ ඉදිරිපත් කල යුතු ලියවිලි

- ස්ථාවර තැන්පතු සහතිකය
- අදාළ තැන්පතු වසර 5 ක් යනතුරු මුදල් කර නොගන්නා බවට එනම් වසර 5 ක් සඳහා බැංකුවේ තැන්පත් කර ඇති බවට **උපකුලපති, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය** නමට බැංකුවෙන් තහවුරුවක් සහිතව ලබාගත් ලිපියක්
- අදාළ ස්ථාවර තැන්පතුව වසර 5 ක් යනතුරු මුදල් කර නොගන්නා බවට එහි හිමිකරුගෙන් සහතිකයක් සහිතව **උපකුලපති, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය** නමට ලබා ගත් ලිපියක්

සැ.යු.

- **තක්සේරු වාර්තාවට අදාල සියලු ලේඛණ වල ඡායා පිටපත් එම වාර්තාව සමග අමුණා තිබිය යුතුය**
- **ඇප සඳහා වත්කම් ඉදිරිපත් කිරීමේදී ඉහත දක්වන ලද තනි ක්‍රමයක් හෝ ඒවායේ මිශ්‍රණයක් භාවිතා කල හැකිය.**
- **ඔබ විසින් ඇප ලෙස තබන කිසිදු ස්ථාවර හෝ ජංගම වත්කමක් විශ්වවිද්‍යාලය විසින් රඳවා ගනු නොලැබේ.**
- **කොටස්, ආභරණ, මැණික් ආදී දෑ වත්කම් ලෙස ඉදිරිපත් කල නොහැක.**
- **අදාළ වත්කමෙහි මුල් පිටපත් හා ඡායා පිටපත් ඉදිරිපත් කල යුතුය. (මුල් පිටපත් පරීක්ෂා කිරීමෙන් පසුව නැවත ඔබ වෙත එවලේම ආපසු දෙනු ලැබේ.)**

**උදා :-**

**ඉංජිනේරු උපාධි පාඨමාලාව සඳහා ඔබ තේරී පත්ව ඇත්නම්**

| | | | |
|---|---|---|---|
| i. | ඇප බැඳුම්කරයේ වටිනාකම | | - රු. 6,600,000/- |
| ii. | පෙන්විය යුතු වත්කම් | ඇපකරු I | - රු. 3,300,000/- |
| | | ඇපකරු II | - රු. 3,300,000/- |
| iii. | ඇපකරු I | තම ඉඩම | - රු. 2,000,000/- |
| | | එහි ඇති ගොඩනැගිල්ල | - රු. 1,300,000/- |
| | | මුළු වත්කම් | - රු. 3,300,000/- |
| iv. | ඇපකරු II | තම ඉඩම | - රු. 1,000,000/- |
| | | වාහනය | - රු. 600,000/- |
| | | ගොඩනැගිල්ල | - රු. 1,000,000/- |
| | | වාර්ෂික දළ වැටුප | - රු. 500,000/- |
| | | ස්ථාවර තැන්පතු | - රු. 200,000/- |
| | | මුළු වත්කම් | - රු. 3,300,000/- |

***<u>ඇපකර සඳහා තක්සේරු වාර්තා ඉදිරිපත් කිරීමේදී අවධානය යොමු කල යුතු විශේෂ කරුණු</u>***

- හවුල් අයිතිය යටතේ පවතින ඉඩම් හා බෙදා වෙන් නොකල ඉඩම් විශේෂ කොන්දේසි මත හැර ඇප බැඳුම්කර සඳහා භාර ගනු නොලැබේ.
- අදාල ඉඩම සඳහා පිඹුරක් සකස් කර නොමැති නම් එවැනි ඉඩම්ද ඇප සඳහා භාර ගනු නොලැබේ.
- ඉඩමෙහි තක්සේරු කරනු ලබන කොටසට පමණක් පිඹුර සකස් කර ඇත්නම් මුල් ඉඩමෙහි පිඹුරද ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
- තෑගි ඔප්පු හා ප්‍රකාශන ඔප්පු මගින් හිමිවූ ඉඩම්, තක්සේරු කර ඉදිරිපත් කරන විට එහි අන්තර්ගත කරුණු විශාල ප්‍රමාණයක් පවතින නිසා එය පැහැදිලි කර ගත හැකි ලෙස සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කල යුතුය
- මෝටර් රථයක් / ගොඩනැගිලි ඇප බැඳුම්කර සඳහා ඉදිරිපත් කරයි නම් ලියාපදිංචි කල දිනයේ සිට ක්ෂය ගණනය කර තක්සේරු වටිනාකමෙන් අඩුකර පෙන්විය යුතුය.
- ජීවිත බුක්තිය තබාගෙන ලියා ඇති ඔප්පු සඳහා තක්සේරු වාර්තා ඉදිරිපත් කිරීමේදී ජීවිත බුක්තිකරු මේ පිළිබඳව විරුද්ධත්වයක් නොමැති බවට ලිපියකින් තහවුරු කල යුතුය.

ඉහත සඳහන් කරුණු නිවැරදිව ඇත්දැයි ලිපි ලේඛන රැගෙන ඒමට පෙර නැවත වරක් හොඳින් පරීක්ෂා කර තහවුරු කරගත යුතුය.

**<u>විශ්වවිද්‍යාලයට පැමිණිය යුතු ආකාරය</u>**

**Dress Code:** Gents – Shirt, Tie and Trouser with blazer
Ladies – Kandyan/ Indian Saree with blazer

- Any query, please call +94 112632028

**සටහන : මෙම උපදෙස් ලිපිය අයදුම්කරුවන් දැනුවත් කිරීම සඳහා පමණක් බවත් මෙය ලද පමණින්ම කිසිදු අයදුම්කරුවකු බඳවා ගැනීම සඳහා සුදුස්සන් නොවන බවද සලකන්න. මෙය ජායා පිටපත් කිරීම හෝ අලෙවිය සඳහා නොවේ.**